ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන - 2020/2021
අවසාන පරීක්ෂණය - 2022
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය සඳහා තාක්ෂණය - SNP8532/ESP2232
කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2022.08.27 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්න වලටද 2 වන කොටසින් ඕනෑම ප්‍රශ්න දෙකකටද (2) 3 වන කොටසින් ඕනෑම ප්‍රශ්න දෙකකට (2) ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. (i) 'අධ්‍යාපන තාක්ෂණය' යන යෙදුම ඔබේ වචනවලින් සාරාංශ කරන්න.

(ii) 'තොරතුරු තාක්ෂණය' සහ 'සහයක තාක්ෂණය' යන යෙදුම්වල වෙනස උදාහරණ ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(iii) අන්තර්කරණ පන්තිකාමර ගුරුවරුන් තම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී පහසුකම් සපයන්නකු ලෙස ඔවුන්ගේ භාවිතාව ඉටු කළ යුතු ආකාරය පැහැදිලි කරන්න.

(iv) අන්තර්කරණ පන්තිකාමර සඳහා ඵලදායී විෂයමාලා අනුවර්තන කාණ්ඩ දක්වන්න.

(v) විෂයමාලා අනුවර්තනය කිරීමට පෙර දුබලතා සහිත දරුවන් සම්බන්ධයෙන් සලකා බැලිය යුතු සාධක මොනවා ද?

(vi) IEP (පුද්ගලානුබද්ධ ඉගෙනුම් සැලැස්ම) ක්‍රියාවලියේ අදියර ලැයිස්තු ගත කරන්න.

(vii) ප්‍රධාන සහයක තාක්ෂණය වර්ග ආකාර තුන (03) කෙටියෙන් පැහැදිලි කරන්න.

(viii) වර්ධක සහ විකල්ප සන්නිවේදන පද්ධති මොනවාද යන්න නිර්වචනය කරන්න.

(ලකුණු 08 x.05 = 40)

## 2 වන කොටස

02. (i) රේඛා ප්‍රක්‍රම ඉගෙනීමේ ප්‍රධාන ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 07)

(ii) බුද්ධිමය දුබලතා සහිත සිසුන්ගේ ඉගෙනීම දිරිමත් කිරීම සඳහා ප්‍රක්‍රම ඉගෙනුම් ක්‍රමය භාවිත කිරීමේ අගය පැහැදිලි කරන්න. (ලකුණු 08)

03. (i) අන්තර්කරණ පාසල් සහ පන්තිකාමර පරිසරය නව්‍යකරණය සඳහා සහයක තාක්ෂණය සමෝධානිත කළ හැක්කේ කෙසේ ද? (ලකුණු 07)

(ii) විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ට ඔවුන්ගේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සහයක තාක්ෂණය භාවිත කිරීමෙන් පහසුකම් සැලසිය හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 08)

04. (i) අන්තර්කරණ පන්තිකාමර තුළ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන්ගේ අධ්‍යාපන ක්‍රියාකාරකම් දිරිමත් කිරීම සඳහා සුහුරු තාක්ෂණයන්හි (Smart Technologies) ප්‍රතිලාභ පැහැදිලි කරන්න. (ලකුණු 07)

(ii) COVID -19 වසංගත තත්ත්වය තුළ අන්තර්කරණ පන්ති කාමරවල උගන්වන ගුරුවරුන් මුහුණ දෙන අභියෝග මොනවා ද? (ලකුණු 08)

05. (i) අන්තර්කරණ පන්තිකාමර තුළ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ පහසුකම් සපයන්නෙකු ලෙස ගුරුවරුන්ගේ නවීන භූමිකාවේ ලක්ෂණ තුනක් (03) සාකච්ඡා කර, ගුරුවරුන්ගේ නවීන භූමිකාව, සම්ප්‍රදායික භූමිකාව සමග සංසන්දනය කරන්න. (ලකුණු 05)

(ii) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන්ට ඉගැන්වීමට සහ පහසුකම් සැලසීමට ඔබට බහුමාධ්‍ය භාවිත කළ හැකි ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10)

## 3 වන කොටස

06. (i) අන්තර්කරණ පන්තිකාමරයක් සඳහා පාඩම් සැලැස්මක් සකස් කිරීමේ දී සලකා බැලිය යුතු ප්‍රධාන සාධක මොනවාද යන්න උදාහරණ ආශ්‍රයෙන් විස්තර කරන්න. (ලකුණු 07)

(ii) අන්තර්කරණ පන්තිකාමරයක ඉගෙනුම් විවිධාංගීකරණය, පාඩම් සැලසුමකට ඇතුළත් කළ හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 08)

07. (i) ඔටිසම් පරාසීය අක්‍රමතාවය සහිත දරුවන්ගේ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ඉගෙනුම් ආධාරක සංවර්ධනය කිරීමේ දී සහ භාවිතා කිරීමේ දී සලකා බැලිය යුතු සුවිශේෂී ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන් සඳහා ඉගෙනුම් -ඉගැන්වීමේ ක්‍රියාවලියේ දී ග්‍රැෆික් සංවිධායකයින්ගේ (graphic organizers) වාසි පරීක්ෂා කරන්න. (ලකුණු 07)

08. ඔබ උගන්වන ශ්‍රේණියකින් ඕනෑම විෂයයක් සඳහා පාඩමක් තෝරා ගන්න.

(i) පාඩමේ සුවිශේෂී අරමුණු තුනක් **(03)** චර්යාමය අරමුණු ආකාරයෙන් ලියා, එම අරමුණු අන්තර්කරණ පන්තිකාමරයක විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ශිෂ්‍යයෙකුට අනුවර්තනය කරන්න. (ලකුණු 06)

(ii) අනුවර්තනය කරන ලද අරමුණුවලට අදාළව සුවිශේෂී ඉගෙනුම් ක්‍රියාකාරකම් හතරක් **(04)** සංවර්ධනය කර සහ අනුවර්තනය කරන ලද අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන්ට ඒවා සහාය වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 09)

09. (i) ඉගෙනීමේ දුෂ්කරතා ඇති දරුවෙකු සඳහා පුද්ගලානුබද්ධ අධ්‍යාපන සැලැස්මක් ක්‍රියාත්මක කිරීමේ පියවර විස්තර කරන්න. (ලකුණු 07)

(ii) ඩවුන්ගේ සහ ලක්ෂණය සහිත දරුවෙකුගේ අධ්‍යාපනික කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා ඔබට පුද්ගලානුබද්ධ අධ්‍යාපන සැලැස්මක් භාවිත කළ හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 08)

හිමිකම් ඇවිරිණි.